# තේල්ස්ගෙන් ආරම්භවී ඇරිස්ටෝටල්ගෙන් අවසන් වන ආදි ග්‍රීක දර්ශනය

**- ආචාර්ය පූජ්‍ය හෝමාගම ධම්මානන්ද හිමි**

පෙරදිග දර්ශන ඉතිහාසය මෙන් බටහිර දර්ශනයේ ඉතිහාසයේ වංශකථාව ද ක්‍රි: පූ: 6 වන සියවස තරම් ඈතට දිවයන්නකි. මිනිසුන් සිතන්නට මතන්නට පටන්ගත් දා පටන් ඔවුන්ට කුතුහලය දැන වූ ප්‍රධාන ගැටළුව වූයේ ලෝකය සහ සත්ත්වයා කෙසේ හටගත්තේද? යන්නයි. ක්‍රි: පූ: 6 වන සියවසට පෙර හෝ පසු, ආසන්න කාලවකවානුව වන විට බොහෝ සෙයින් හැදී වැඩී පෝෂණය වී ගොඩනැගී තිබුණු පෙරදිග හා අපරදිග වශයෙන් මූලිකව වෙන් කෙරෙන ප්‍රධාන ශිෂ්ටාචාර (civilization) (මොහෙන්දෝජාරෝ හරප්පා ශිෂ්ටාචාරය, මොසපොටේමියානු ශිෂ්ටාචාරය ආදිය) තුළ මෙම ගැටළුව සාකච්ඡා කිරීම පිණිස චින්තකයන් විවිධාකාරයෙන් ප්‍රවේශ වූයේ ආගමික පසුබිම් ඔස්සේය.

පෙරදිගත් බටහිරත් දාර්ශනික යැයි හඳුනා ගන්නා චින්තන පද්ධතීන් ගොඩනැගෙන්නේ, ආගමික සංකල්ප පසුබිම් කරගෙනය. එනම් දර්ශනයට පෙර පැවතියේ ආගමයි. කරුණු අධ්‍යයනය කිරීමේදී අපට පෙනී යන්නේ, පෙරදිගත් බටහිරත් ආගමෙන් දර්ශනය බිහි වන බවයි. මේ නිසා පැරණි පෙරදිග චින්තනාවලියෙහි මූලික අවස්ථාව සහ පැරණි බටහිර (ග්‍රීක) චින්තනාවලියෙහි මූලික අවස්ථාව දාර්ශනික ස්වභාවයක් ගන්නේ යැයි පැවසීම දුෂ්කරය. විචාරයෙන් තොරව මෙන් ම



බියමුසු චකිතයකින් යුතු මානසික පසුතලයකින් බිහිවුණු මේ විශ්වාස, සැබවින් ම මිථ්‍යාමය ය. මෙසේ පැවසෙනුයේ තර්කය පදනම් කොට ගොඩනැගුණු සංකල්ප නොමැති හේතුවෙනි.[1] බටහිරට වඩා පෙරදිග දාර්ශනික චින්තාවන් ආගමෙන් වෙන්කර ගත නොහැකි තරමට ආගම හා බද්ධවී, මිශ්‍රවී ඇති අතර අපරදිග කිසියම් අවධියකදී පැහැදිලිව ම ආගමික චින්තනයෙන් දාර්ශනිත චින්තාව වෙන්වී ස්වාධීනව ගොඩනැගුණ ද පසුව විද්‍යාත්මක චින්තනය සමග බරපතල ලෙස බද්ධවී තිබේ. මේ නිසා බටහිර චින්තනයත් බටහිර විද්‍යාවත් එකට අත්වැල් බැඳගෙන ගොඩනැගුනක් ලෙස විශේෂයෙන් හඳුන්වා දිය හැකිය.[2] බටහිර දාර්ශනික චින්තාවේ ආරම්භක අවධියේ තත්ත්වය එසේ වුවත් පසුව නැවතත් බටහිර දර්ශනය ආධානග්‍රාහී ආගමික චින්තාවේ පතුළට ම කිඳා බැස තිබේ. එසේ වූයේ විශේෂයෙන් ම බටහිර දර්ශන ඉතිහාසයේ මධ්‍යතන අවධියේදීය. මධ්‍යතන අවධියෙන් ආරම්භ වන මේ ආගමික චින්තාවේ බලපෑම බටහිර දර්ශන ඉතිහාසයේ සමකාලීන අවධිය දක්වාත් සිදුවී ඇති අතර, සමහර විටකදී අතරින් පතර සමකාලීන දාර්ශනිකයන් කෙරෙහිත් ඍජු ලෙසත් වක්‍රාකාරවත් බලපා ඇති සෙයක් විද්‍යමාන වේ.

මෙසේ දිගහැරෙන බටහිර දර්ශනයේ නිජබිම ග්‍රීසිය වේ. ග්‍රීසිය කේන්ද්‍ර කොට ගොනැගුණු බටහිර දාර්ශනික සංකල්පනා හදිසියේ, ආකස්මිකව පහළවූ චින්තාවලියක් නොව දිගු කලක් තිස්සේ මිනිසුන්ගේ සිතුම් පැතුම් ඔස්සේ ගොඩනැගුණකි. ඒ තුළ විවිධ හැලහැප්පීම් පැවතිණ. දාර්ශනික මත වාද බිහි වන්නේ, සාම්ප්‍රදායික සුපුරුදු චින්තනයෙන් ඔබ්බට ගොස් විප්ලවීය ලෙස නවතම ආකාරයකට සියුම්ව චින්තනය හැසිරවීමෙහි ප්‍රතිඵලයක් ලෙසය. දාර්ශනික මනසක සුවිශේෂ ලක්ෂණයක් වන්නේ, යමක් විනිවිද දැකීමේ හැකියාවයි. ක්‍රි: පූ: හයවන සියවස වන විට මෙවන් වූ වට පිටාවක් ග්‍රීක මහා සංස්කෘතිය තුළ ගොඩනැගී, නිර්මාණය වී පැවතිණ. විවිධ

විද්වතුන්, චින්තකයන්, කවියන්, මිථ්‍යා කථා ප්‍රබන්ධකයන්, මෙම සංස්කෘතිය ඔපවත් කර පෝෂණය කර තිබිණ. **හෝමර්, හෙසියඩ්** වැනි කවියෝ මේ අතර කීර්තිධර වූහ. සත් ප්‍රඥාවන්තයින් **(තේල්ස්, පිටකස්, බියස්, සොලොන්, පිඇන්ඩර්, ක්ලියෝබිලස්, චිලොන්)** ලෙස ප්‍රසිද්ධියට පත් තවත් විද්වතුන් කණ්ඩායමක් පිළිබඳව ද තොරතුරු අනාවරණය වේ.

මෙසේ ගොඩනැගෙන දැවැන්ත ග්‍රීක දර්ශනය පරිශීලනය කිරීමේදී අපට හමු වන පළමු ග්‍රීක දාර්ශනිකයා **තේල්ස්** (***Thales,*** *ක්‍රි:පූ: 624-546*) බව විවාදාත්මක වූවක් නොවේ. එසේම මොහු සත්ප්‍රාඥයින්ගෙන් කෙනෙකු බව ද පිළිගැනේ. 'නොයෙක් ටීකාකාරයන්, අර්ථකථාචාර්යයන් **'සත්ප්‍රඥාවන්තයින්'** ලෙස නොයෙක් පැරණි චින්තකයින්, කවියන් හා රජවරුන්ගේ නම් ඉදිරිපත් කොට ඇත. **ඩිකිඉයර්කස්ට** අනුව මොවුහු (තේල්ස් හැර) දර්ශනවාදීන් හෝ චින්තකයින් හෝ නොවෙති. රාජ්‍යයෙහි පරිපාලන කටයුතු ආදියෙහි චතුරයන් ලෙස ඔවුන් පිළිගනු ලැබේ. එහෙත් මේ සියලු දෙනා ම තේල්ස්ගේ නාමය ඉදිරිපත් කිරීමට අතපසු කර නොමැත. මෙයින් ගම්‍ය වන්නේ තේල්ස් නැමැති දාර්ශනිකයා ග්‍රීක දර්ශනයේ ගෞරව පූර්වක ස්ථානයක් ගෙන වැජඹෙන බවයි.'[3] 'බටහිර දර්ශනයේ පියා', 'ග්‍රීක දර්ශනයේ පියා යනාදී විවිධ විරුදාවලීන් ආරෝපණය කර ඇති තේල්ස්, සැබවින් ම බටහිර දර්ශනයට පළමු පියවර තැබූ තැනැත්තා ලෙස සැලකීමට විශේෂ වශයෙන් ඔහු සිදු කළ චින්තන විප්ලවය කුමක්ද?

තේල්ස්ගේ අවධිය වන විට සාම්ප්‍රදායික චින්තනය හිරවී තිබුණේ පුරාණ දේව කථා, මිථ්‍යා ප්‍රබන්ධ කථා, සහ අද්භූත ප්‍රබන්ධ කථා ආදිය මතය. මෙම ගතානුගතික චින්තනය කිසියම් අභියෝගයකට ලක්කරමින්, අමුතුම අකාරයකට තමා සහ තමා අවට ලෝකය පිළිබඳව තේල්ස් තම චින්තනය මෙහෙයවීය. ඒ ඔස්සේ සාමාන්‍ය කෙනෙකුට විද්‍යමාන නොවන, මනස නොගැටෙන, විශ්වයේ ක්‍රියාකාරිත්වය, එහි ස්වභාවය සහ



පැවැත්ම පිළිබඳ විවිධ මත පලකරමින්, පැවති සමාජයට නවතම මතයක්, හෙවත් සංකල්පනාවක් තේල්ස් ඉදිරිපත් කළේය. එනම් ලෝකයේ එකම මූල පදාර්ථය 'ජලය (***Water***) වේ' යැයි කීමයි.

තේල්ස් ග්‍රීක දර්ශනයේ ප්‍රාරම්භකයා ලෙස සැලීමට කරුණු දෙකක් මුල්වී තිබේ. එනම්,

1. **සූර්යග්‍රහණයක් පිළිබඳ ඉතාම නිවැරදිව මත ප්‍රකාශ කර තිබීම සහ**
2. **ලෝකයේ මූල ධාතුව ජලය යැයි කීම**[4]

මෙයින් සූර්යග්‍රහණය පිළිබඳව දින වකවානු සහිතව ඉතාම නිවැරදිව මත ප්‍රකාශ කිරීම සැබවින් ම එකලට සාපේක්ෂකව ඇදහිය යුතු කරුණකි. තේල්ස්ගේ බුද්ධි මහිමය මොනවට ප්‍රකට කරන බව මෙයින් පෙනී යන්නේ, විශ්වයේ ග්‍රහ වස්තූන්ගේ චලිතය පිළිබඳ පෘථුල දැනුමක් හෙවත් තාරකා ශාස්ත්‍රය ඔහු මැනවින් ප්‍රගුණ කර තිබුණ බවයි. එහෙත් සමහර දර්ශන විචාරකයන්ගේ මතය වී තිබෙන්නේ, සූර්යග්‍රහණය පිළිබඳ මත පල කිරීම තේල්ස්ගේ ස්වාධීන බුද්ධිය මෙහෙයවා සිදු කළ දෙයක් නොවන බවයි. 'මෙය ඔහුගේ අපූර්ව බුද්ධිය පෙන්වන ප්‍රපඤ්චයක් නොවන බව සමහර දර්ශන විචාරකයෝ පවසති. එයට හේතුව නම්, මේ සමයේදී මිලෙටස්, ලිඩියාව සමග මිතුරු සබඳකමින් පසුවීමයි. ලිඩියාවට බැබිලෝනියාව හා සංස්කෘතික සබඳකම් තිබීය. බැබිලෝනියන්වරු එම සමයේදී පවා සූර්ය ග්‍රහණ, චන්ද්‍ර ග්‍රහණ ආදිය නිවැරදිව පැවසුවෝය. එහෙත් මේ විශ්වාස පිළිබඳ කරුණු සමූහය ඔවුන් යොදන ලද්දේ හුදෙක් මිථ්‍යා කටයුතු සඳහා පමණි. තේල්ස් ඊට වෙනස් වූ විද්‍යාත්මක මාර්ගයක් අනුගමනය කරමින් එම කරුණු විභජනය (***Analysis***) කොට විද්‍යාත්මක කරුණු සනාථ කිරීමට උපයෝගී කොට ගත් බව අපට බොහෝ දුරට පිළිගත හැක.'[5] සූර්යග්‍රහණය පිළිබඳ මෙම අනාවැකිය පළකිරීමටත් වඩා වැදගත් වන්නේ, ලෝකයේ මූලධාතුව ජලය යැයි කී දෙවන කියමනයි.[6] එයට ප්‍රධාන හේතුව

මිථ්‍යා මතවල වෙලී පැටලී සිටි සමාජයකට දැස් හැර ලෝකය දෙස බලන්නට, ස්වාධීනව චින්තනයෙහි යෙදෙන්නට, අවශ්‍ය වටපිටාව එම ප්‍රකාශය මගින් හෙළි පෙහෙළි කළ බැවිනි. එපමණක් නොව තමන් ඉදිරිපත් කළ නවතම සංකල්පය සමාජයට ඒත්තු ගැන්වීම ද මහත් විප්ලවයකි.

ජලයේ ක්‍රියාකාරීත්වය, එහි සංයුතිය සහ ස්වභාවය මැනවින් නොදැන මෙවැනි ප්‍රකාශයක් කළ නොහැකිය. අපට පෙනෙන ලෝකයේ නොපෙනෙන යථාර්ථය (***Reality***) කුමක්දැයි ප්‍රශ්න කර එයට පිළිතුරු වශයෙන් එම නොපෙනෙන යථාර්ථය නම් ජලය වේ යැයි පවසන්නේ, එහි සුවිශේෂ ලක්ෂණ ද විවරණය කරමිනි.[7] සාමාන්‍යයෙන් ද්‍රව වශයෙන් පවතින ජලය විටෙක වාෂ්ප බවටත් තවත් වරෙක මිදී අයිස් බවටත් පරිවර්තනය වේ. භෞතික පදාර්ථයන්ගේ සම්භවයත්, පැවැත්මත්, එසේම ජීව පදාර්ථයන්ගේ සම්භවයත් පැවැත්මත් ජලය මත රඳාපවතී. ජලයෙහි පවතින ජීවමය ශක්තිය වෙනත් කිසිදු පදාර්ථයක දක්නට නැත. අවසාන වශයෙන් තේල්ස් සඳහන් කරන්නේ, සියල්ලේ මූලය සහ පැවැත්ම ජලය බවයි. මෙය ප්‍රස්තුත තුනක් ඔස්සේ තේල්ස් ඉදිරිපත් කරයි. 'ඇරිස්ටෝටල් තමාගේ අධිභෞතික වාදයෙහි පවසන අන්දමට ලෝකය පිළිබඳ තේල්ස් මෙසේ කියා ඇත. එනම්,

1. **ලෝකය ජලය මත පාවේ**
2. **ලෝකයේ සියලු වස්තූන් සෑදී ඇත්තේ ජලයෙනි**
3. **සියලු ද්‍රව්‍ය වස්තූහු දෙවියන්ගෙන් හෝ ආත්මයකින් හෝ ජීවයකින් හෝ සෑදී වැජඹෙති**

මේ ඉහත සඳහන් අදහස් දාර්ශනික ලෙස අර්ථවත් කළ විට අපට ලැබෙන ප්‍රස්තුතය නම් 'ජලය ස්ථිර වස්තුව වන අතර අනෙක් සියලු වස්තූන් ජලයෙහි අස්ථිර පෙනීම් පමණි යන්නයි.'[8]



ඉහත ප්‍රස්තුත තුනෙන් තුන්වැන්න ගැන යමක් සඳහන් කළ යුතුය. එය දෙවැනි ප්‍රස්තුතය සමග සසඳන විට කිසියම් පරස්පරතාවක් (*Contradiction*) ප්‍රකට කරන බැවිනි. තේල්ස්ගේ සමස්ත දර්ශනයේ මූලික ප්‍රස්තුතය වන්නේ, දෙවැනි ප්‍රස්තුත යයි. එහෙත් තෙවැනි ප්‍රස්තුතයෙන් කියා සිටින්නේ, එය නිශේධනය කිරීමක්ද? කිසිසේත් ම විය නොහැකිය. දෙවියන්, ආත්මය, ජීව පදාර්ථය, යනාදියෙන් අර්ථවත් වන්නේ, 'ජලය' යන්නද?, කිසිසේත් ම විය නොහැකිය. ජලය සියල්ලේ මූල පදාර්ථය බව සැබවි. දෙවියන් හෝ ආත්ම හෝ ජීව වශයෙන් හඳුන්වන්නේ, ජීව ශක්ති යයි. මෙයින් සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින දේව සංකල්පය හෝ ආත්ම සංකල්පය හෝ ජීව සංකල්පයක් අර්ථවත් නොවේ. එයින් කිය වෙන්නේ, භෞතිකය චලනය කරවන මූලික ශක්තිය වන කාන්දම් බලයයි. 'වස්තූන් එහා මෙහා කිරීමට කාන්දමට හැකි බැවින් එයට ආත්මයක් හෝ ජීවයක් හෝ ඇති වග තේල්ස් විශ්වාස කළ බැව් ඇරිස්ටෝටල් ගෙන් අපට දැන ගන්නට පුළුවන.'[9] 'දෙවිවරුන් ලෙස විස්තර කරනුයේ ගස් ගල්වල ඇති කාන්දම් බලයයි, යන්න පිළිගත හැකි බව පැහැදිළි වෙයි. මේ නයින් බලන කල සමස්ත විශ්වය ම දෙවිවරුන්ගෙන් පිරී පවතිතැයි තේල්ස් කළ ප්‍රකාශයෙන් ඔහු අදහස් කළේ කිසිසේත් සාම්ප්‍රදායික දෙවිවරුන් නොවන බව පෙනේ.'[10] එහෙත් පසුකාලීන සමහර දාර්ශනිකයින්ගේ සහ චින්තකයින්ගේ විශ්වාසය වන්නේ, මෙයින් ජගදාත්මයක් හෝ සර්වේශ්වර වාදයක් ගම්‍ය වන බවයි. පසුකාලීන දේවවාදී ආගමික සංකල්පයන්ට මෙය කිසියම් බලපෑමක් කර ඇතැයි ද සමහරු අනුමාන කරති. කෙසේ නමුත් උක්ත ප්‍රස්තුත තුන මගින් තේල්ස්ගේ දාර්ශනික චින්තනය සංක්ෂිප්තව මැනවින් ඉදිරිපත් වී ඇතැයි කීම යුක්ති යුක්තය.

තේල්ස්ගේ දාර්ශනික සංකල්පනාව අංග සම්පූර්ණ වූ එකක් ලෙස පිළි නොගැනේ. එහි විවිධ දුර්වලතා සහ අඩුපාඩුකම් පවතී. එසේ පවසන්නේ, එය වෙනත් දාර්ශනික පද්ධතියක් සමග

සැසඳීමෙනි. එහෙත් මෙහි අපට වැදගත් වන්නේ, දාර්ශනික වශයෙන් පවත්නා දුර්වලතා නොව ඔහු සිදු කළ චින්තන විප්ලවයයි. එනම් පැවති මිථ්‍යා මතවලින් ඉවත්වී නවතම මාවතක් ඔස්සේ තම ස්වාධීන චින්තනය නිර්භයව දියත් කිරීමයි. සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැර වී නවතම ආකාරයකට සිතන්නට තේල්ස් පසුබිම් සකස් කළේය. මෙම ක්‍රියාවලිය නූතන බටහිර දර්ශනයේ පියා ලෙස සැලකෙන රෙනේ ඩේකාට්, *(ක්‍රි:ව: 1596-1650)* පැවති ආධානග්‍රාහී ආගමික චින්තනයෙන් මිදී බුද්ධිවාදී දාර්ශනික සම්ප්‍රදාය ඉදිරිපත් කරමින් සිදු කළ චින්තන විප්ලවය මෙන් වූ චින්තන විප්ලවයකි.

විශ්ව විද්‍යාත්මක සංකල්පයක් කේන්ද්‍රීය කොට ගෙන ඇරඹි ග්‍රීක දර්ශනය තේල්ස්ගේ පටන් ඇරිස්ටෝටල් දක්වා විහිදී යයි. ග්‍රීක අවධිය නියෝජනය කරන දර්ශනවාදීන් රාශියකි. ඒ අතර තේල්ස්, *(ක්‍රි:පූ:624-546)* ඇනැක්සිමැන්ඩර්, *(ක්‍රි:පූ:610-545)* ඇනැක්සිමීනිස්, *(ක්‍රි:පූ:588-524)* පයිතගරස්, *(ක්‍රි:පූ:560-480)* සේනොෆනිස්, *(ක්‍රි:පූ:570-480)* හෙරක්ලීටස්, *(ක්‍රි:පූ:536-470)* පාමිනයිඩීස්, *(ක්‍රි:පූ:510-540)* සේනෝ, *(ක්‍රි:පූ:490)* එම්පිඩෝක්ලීස්, *(ක්‍රි:පූ:495-433)* ඇනැක්සගෝරස්, *(ක්‍රි:පූ:500-428)* ඩිමෝක්‍රිටස්, *(ක්‍රි:පූ:460-370)* විතණ්ඩවාදීන්, සොක්‍රටීස්, *(ක්‍රි:පූ:469-399)* ප්ලේටෝ, සහ *(ක්‍රි:පූ:429-347)* ඇරිස්ටෝටල්, *(ක්‍රි:පූ:389-322)* විශේෂයෙන් සඳහන් කළ හැකිය.

මෙම දාර්ශනිකයන් ඔවුන්ගේ දාර්ශනික මතවාද කේන්ද්‍ර කොටගෙන විවිධ කණ්ඩායම්වලට හෙවත් ගුරුකුලවලට බෙදිය හැකිය. එමෙන්ම ඔවුන් නියෝජනය කෙරෙන ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන ද යම් යම් ගුරුකුලයන්ට බෙදේ. නිදසුන් ලෙස මෙලේසියානු හෙවත් අයෝනියානු ගුරුකුලය[11] දැක්විය හැකිය. එම බෙදීම් අතර ප්‍රධාන ප්‍රභේදයක් වන්නේ, චින්තනය වෙනස්වීමේ අවධි ලක්ෂණය පදනම් කොට කෙරෙන බෙදීමයි. ඒ අනුව ග්‍රීක දර්ශනය නියෝජනය කෙරෙන සියලු දාර්ශනිකයන් මූලික වශයෙන් කොටස් දෙකකට බෙදේ. එනම්,



1. පූර්ව සොක්‍රටීසියානු දාර්ශනිකයන්
2. පශ්චාත් සොක්‍රටීසියානු දාර්ශනිකයන්

වශයෙනි. මෙම බෙදීමෙහි ඇති වැදගත් ප්‍රධාන අර්ථය වන්නේ, ග්‍රීක දර්ශනයේ පැහැදිලි හැරවුම් ලක්ෂයක් (***Turning point***) සොක්‍රටීස්ගේ අවධිය තුළ සිදු වන නිසාය.

සොක්‍රටීස්ට පූර්වගාමී දාර්ශනිකයන්ගේ (විශේෂයෙන් විතණ්ඩවාදීන් දක්වා) කේන්ද්‍රීය දාර්ශනික තේමාව වූයේ විශ්වයේ සැකැස්ම (***Structure***) සම්භවය (***Origin***) සහ පැවැත්ම (***Excistence***) කෙසේදැයි සාකච්ඡා කිරීමයි. නිදසුන් ලෙස තේල්ස් ජලය කේන්ද්‍රීය කොට ගත්තාක් මෙන් ඔහුගෙන් පසුව අපට හමු වන බොහෝ දාර්ශනිකයන් ද ඒ ඔස්සේ යමින් මහාභූත ධර්මයන් හා තවත් දේ විෂය කොට ගෙන විශ්වයේ හටගැන්මත් ස්වභාවයත් පැවැත්මත් පිළිබඳව කරුණු දක්වා තිබේ.

ඒ අනුව ඇනැක්සිමැන්ඩර් සඳහන් කර සිටියේ, සම්මත භෞතික ලෝකයේ ප්‍රභවය අපෙයිරෝන් හෙවත් අසීමිතත්වය (**Boundless**) නැමැති මූල පදාර්ථයෙන් සිදු වුණු බවයි. ඔහු සඳහන් කරන පරිදි 'සියලු දැයම එකම මූල ද්‍රව්‍යයක් ප්‍රභව කොට ඇත්තේ යයි ඔහු පිළිගත්තේය. එහෙත් එය තේල්ස් කියා සිටි පරිදි, ජලය හෝ අප දන්නා අනික් ද්‍රව්‍යයක් හෝ නොවේ. එය අපරිමිතය. ශාස්වතය, අජරය. තව ද එය සකල ලෝක ධාතුන් ම වට කොට සිටී. අපගේ ලෝකය වූකලී ලෝක ධාතූන් රාශියක් අතුරෙන් එකකැයි ඔහු සිතීය. අපට හුරු පුරුදු විවිධ ද්‍රව්‍යයන් බවට හැරෙනුයේ, මූල පදාර්ථ යයි. ඒවා එකිනෙකක් අනික බවට හැරේ.'[12] මෙයින් ඔහු තවදුරටත් සඳහන් කර සිටින්නේ, අවසාන වශයෙන් යමකින් යමක් උපදී ද එය ඒ දෙය කරා ම නැවතත් ගමන් ගන්නා බවයි. 'මේ අනිශ්චිත මූල පදාර්ථය විශේෂ ද්‍රව්‍ය වස්තුවක් නොවේ. එහෙත් විශේෂ ද්‍රව්‍ය වස්තුවකට (එනම් ජලය, අග්නිය, වායුව සහ පෘථිවිය) පරිණාමය

වීමට කුසලතාවයක් එම මූල පදාර්ථයට ඇත. අනෙක් සියලු ද්‍රව්‍ය වස්තූන්ගේ ප්‍රභවය එය බැවින් එම මූල ධාතුව ලෝකය පාලනය කෙරේ. තව ද මේ මූල ධර්මය ජරාපත් නොවනවා පමණක් නොව දිව්‍යමය ද වේ යැයි ඔහු පවසා ඇත. සිව් මහා භූතයන්ට හාත්පසින් ම වෙනස් වූ මේ මූල පදාර්ථය අපෙයිරෝන් යයි ඇනැක්සිමැන්ඩර් පැවසුවේය. නව නාමයක් ප්‍රබන්ධ කිරීමට ඔහුට සිදුවුණා වැනිය. මෙහි අර්ථය වනාහී 'අසීමිතය' (**Boundless**) යන්නයි.'[13]

මීලඟට අපට හමු වන ඇනැක්සිමීනිස් විශ්ව සම්භවය පිළිබඳ මත ප්‍රකාශ කරමින් කියා සිටියේ, සියල්ල ප්‍රභවය වූයේ, වාතය හෙවත් වායෝ ධාතුවෙන් (***Air***) බවයි. වායුව මූල පදාර්ථය ලෙස දක්වන මොහු මෙසේ ප්‍රකාශ කර සිටී. 'ආත්මය වාතයයි. අග්නිය විරලී කෘත වාතයයි. ඝනීභූත කෙරුණු විට වාතය පළමුව ජලය බවට පත්ව යළි තවදුරටත් ඝනීභූත කෙරුණොත් පඨවි බවටත් අවසානයේදී පාෂාණ බවටත් පත්වේ. ඝනීභවනය වීමේ ප්‍රමාණය මත පිහිටා, වෙනස් ද්‍රව්‍යයන් අතර ඇති වෙනස්කම් සියල්ලක් ප්‍රමාණාත්මක කිරීමේ ගුණය මෙම සිද්ධාන්තයෙහි ඇත.'[14] යනුවෙනි. ඇනැක්සිමීනිස් සඳහන් කරන ආකාරයට 'මූල පදාර්ථය වන වායු ධාතුව වනාහී චලනයෙන් යුතු වේ. එය වායු ධාතුවේ ආවේණික ගුණයකි. මෙසේ චලනය වන වායු ධාතුවෙහි ආවේණික ගුණයක් නොවන්නේ නම් විපරිනාමය එවිට සිදු නොවේ. විපරිනාමය නොමැති නම් විශ්වය බිහි නොවේ. මින් ගම්‍ය වන්නේ, වායු ධාතුවෙහි අවේණික වන චලනයේ ඇති වැදගත් බවය.'[15] තේල්ස්, ඇනැක්ස්මැන්ඩර් සහ ඇනැක්සිමීනිස් යන තිදෙනා මෙලේසියානු දාර්ශනිකයන් යන අපරනාමයකින් ද හඳුන්වන අතර විශ්ව සම්භව විද්‍යාව පිළිබඳ මත ප්‍රකාශ කළවුන් බව මෙයින් සනාථ වේ.

ප්‍රාග් සොක්‍රටීසියානු දාර්ශනිකයන් අතර සුවිශේෂී දාර්ශනිකයකු ලෙස හෙරක්ලීටස් හඳුන්වා දිය හැකිය. ලෝක සම්භවය පිළිබඳ ඔහුගේ අදහස වූයේ සතර මහා භූතයන්ගෙන්



එකක් වන අග්නිය හෙවත් ගින්න (***Fire***) යන්න ඒ සඳහා මූල පදාර්ථය වූ බවයි. ඔහු පෙන්වා දෙන පරිදි 'සියල්ලන්හට එක සමාන වූ මේ ලෝකය කිසියම් ඊශ්වරයකු හෝ මිනිසකු විසින් තනන ලද්දේ නොවේ. එය සදා පැවති, දැනුදු පවතින, අනාගතයේ ද පවතින්නා වූ සදාකාලික, සදා ජීව, එක්තරා ප්‍රමාණයක් දැල්වෙමින් ද එක්තරා ප්‍රමාණයක් නිවෙමින් ද තිබෙන අග්නියකි'[16] හෙරක්ලීටස් සුවිශේෂී දාර්ශනිකයකු ලෙස ඉහතදී හඳුන්වා දුන්නේ, භෞතික ලෝකය පිළිබඳව පමණක් නොව මිනිස් ජීවිතයේ යථා ස්වභාවය පිළිබඳව ද යමක් කීමට උත්සාහ ගෙන ඇති බැවිනි. ස්ථිරව, සදාතනිකව, අවිනාශීව, කිසිවක් නොපවත්නා බව ඔහු කියයි. එනම් අනිත්‍යතාව යයි. අභ්‍යන්තරික වශයෙන් හා බාහිර වශයෙන් සිදු වන එම විපරිණාමය 'එකම ගඟට දෙවරක් බැසිය නොහැකිය' යන කියමන ඔස්සේ ඔහු මැනවින් ඉදිරිපත් කර තිබේ.

පූර්ව සොක්‍රටීසියානු දාර්ශනික අවධිය නියෝජනය කරන දාර්ශනිකයන් අතරින් අප ඉහත දී සාකච්ඡාවට භාජනය කරන ලද්දේ දාර්ශනිකයන් කිහිප දෙනෙකු පිළිබඳව පමණි. මෙසේ සොක්‍රටීස්ට පූර්වගාමී වූ දාර්ශනිකයන් භෞතිකය කේන්ද්‍රීය කොටගෙන තම චින්තාවන් මෙහෙය වූ අතර සොක්‍රටීස්ට සමකාලීන වූ විතණ්ඩවාදීන් ග්‍රීක දර්ශනයේ විෂය තේමාව වෙනත් දිසාවනතියකට යොමු කිරීමට උත්සාහ ගෙන තිබේ. පැවති ග්‍රීක දාර්ශනික ආකල්ප නවතම අංශයකට නැඹුරු කරන ලද විතණ්ඩවාදීන් නිසා නව නැම්මක් ග්‍රීක චින්තනයේ සිදු විය.[17] දාර්ශනිකයාගේ කාර්යභාරය විය යුත්තේ, භෞතික ලෝක විෂය පිළිබඳව සාකච්ඡා කිරීම නොව පුද්ගලයා හා බැඳී පවතින ප්‍රපඤ්චයන් කේන්ද්‍රීය කොට ගැනීම යයි ඔවුහු අවධාරණය කළහ. මෙයින් අදහස් කෙරෙන්නේ, මීට පෙර සිටි කිසිදු දාර්ශනිකයකු මිනිසා පිළිබඳ කිසිවක් සාකච්ඡා කළේ නැත යන්න නොවේ. විතණ්ඩවාදීන් විසින් සිදු කර ඇත්තේ, මිනිසා කේන්ද්‍රීය කොට දර්ශන විෂයයේ කාර්යභාරය සහ ගමන්මග ප්‍රායෝගිකව ම නවතම මාවතකට යොමු කිරීමයි.

එසේද වුවත් විතණ්ඩවාදීන් දාර්ශනිකයන් යැයි පිළිගැනීමට පවා සමහර දර්ශන විචාරකයෝ මැලි වෙති. ඒ අතර සොක්‍රටීස් සහ ප්ලේටෝ ප්‍රමුඛ වෙති.[18] 'ඔවුන් දාර්ශනික කණ්ඩායමක් නොවුව ද අධ්‍යාපනයක් ලබාදීම සඳහා මුදල් අයකරන ලද කණ්ඩායමක් ලෙසින් පිළිගැනීම නම් බොහෝ දුරට නිවැරදිය. ඉන් පැවසෙන්නේ, කුමක් හෝ දාර්ශනික පද්ධතියකට විතණ්ඩවාදීන් සියල්ල ම පාහේ මූලිකව කටයුතු කළ බවක් නොවේ. නොයෙක් අවස්ථාවන්හිදී පැන නැගෙන ප්‍රශ්නවලට ක්ෂණික පිළිතුරු දිය හැකි ශාස්ත්‍ර, වාද ශාස්ත්‍ර වැනි දේවල් පිළිබඳව ඔවුහු ග්‍රීක තරුණ පරම්පරාවලට ඉගැන්වූහ. එය එක්තරා අන්දමක ඥානයක් ලබා දෙන සුළුය. මීට පෙර සිටි ග්‍රීක දාර්ශනිකයන් විශ්වයත් මනුෂ්‍යයාත් පිළිබඳව නොයෙක් දාර්ශනික අදහස් (මේ අදහස්වල පිළිබිඹු වන්නේ ඥානයයි.) ඉදිරිපත් කර ඇති බව සත්‍ය වුවද ඥානය ප්‍රායෝගික අන්දමින් ක්‍රියාවට පරිවර්තනය කිරීමක් පිළිබඳ උපදෙස් හෝ පුහුණු කිරීමක් හෝ තිබී නැත. ඒ ක්‍රමය මුළුමනින් ම ඉදිරිපත් කරන ලද්දේ මේ විතණ්ඩවාදීන් විසිනි.[19] කෙසේ වෙතත් දාර්ශනික චින්තන ධාරාව නවමු මාවතකට යොමු කිරීමට මොවුන්ගේ ක්‍රියා දාමය පදනමක් වූයේ යැයි කීම යුක්ති යුක්තය. මෙම පසුබිම මත ගොඩනැගෙන ග්‍රීක දර්ශනයේ දෙවන අදියර වශයෙන් පශ්චාත් සොක්‍රටීසියානු දාර්ශනික අවධිය හඳුන්වා දිය හැකිය.

පශ්චාත් සොක්‍රටීසියානු දාර්ශනික අවධිය නියෝජනය කරන දාර්ශනිකයන් තිදෙනෙකි. සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යනු එම තිදෙනායි. පොදුවේ පසුකාලීන දාර්ශනිකයන් හා දර්ශන විචාරකයන්ගේ පිළිගැනීම වන්නේ, සමස්ත ග්‍රීක දර්ශන ඉතිහාසයේ අපට හමු වන වැදගත් ම දාර්ශනිකයන් තිදෙනා මොවුන් බවයි. මොවුන් තිදෙනා පිළිබඳව ද සංක්ෂේප වශයෙන් යමක් සටහන් කළ යුතුය.

සොක්‍රටීස් වඩාත් ප්‍රචලිත වන්නේ, ඔහුගේ සූක්ෂම වූ බුද්ධි මහිමය නිසාය. ඥානවිභාගය පිළිබඳ සොක්‍රටීස් බුද්ධිවාදී මතයක්



දැරීය. 'ඉන්ද්‍රියානුසාරයෙන් දැනුම ලබා ගැනීමට විතණ්ඩවාදීහු තැත් කළහ. එහෙත් දැනුම ලබාගත හැක්කේ බුද්ධියේ මාර්ගයෙන් බවත් සත්‍ය දත හැක්කේ බුද්ධියෙන් පමණක් බවත් සොක්‍රටීස් පෙන්වා දුන්නේය.'[20] එනම් අපගේ දැනුම-ඥානය සංවිධානය වන්නේ, ඉන්ද්‍රිය ගෝචර සංකල්ප ඔස්සේ නොව බුද්ධි ගෝචර සංකල්ප ඔස්සේ බවයි. තාර්කික චින්තනය, මෙහි ප්‍රධාන වේ. ඔහුගේ මූලික ව්‍යායාමය වූයේ විතණ්ඩවාදීන් විසින් නැති කිරීමට උත්සාහ කළ සහ යම් ප්‍රමාණයකින් නැති කළ සාම්ප්‍රදායික ග්‍රීක චින්තනයේ හරපද්ධතීන් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමයි. 'ඔහු මුළු ජීවිත කාලය ම දර්ශනය සඳහා කැප කළේ හුදෙක් විතණ්ඩවාදීන්ගේ සංශයවාදයේ සහ නාස්තික වාදයේ ඇති අර්ථශූන්‍ය බව ග්‍රීකයන්ට අවබෝධ කරවීමටය. 'සත්‍යයන් නොමැත, ඥානයක් නොමැත, ආගමක් නොමැත, සදාචාරයක් නොමැත' නැමැති මූලික පදනමෙන් ගොඩනැගුණ විතණ්ඩවාදීන්ගේ දර්ශනය ග්‍රීක සභ්‍යත්වය නසාලන සුළු යයි සිතූ හෙයිනි, ජනාකීර්ණ ස්ථානයන්හි නොයෙක් දාර්ශනික ගැටළු පිළිබඳ සාකච්ඡා පැවැත්වීට ඔහු පටන් ගත්තේය'.[21] තවද මිනිසුන් වැඩිපුර ගැවසෙන ස්ථානවලට ගොස් කතා පැවැත්වීම සොක්‍රටීස්ගේ දිනචරියාවේ එක් අංගයකි. නිදහස්ව අදහස් ප්‍රකාශ කර මිනිසුන් දැනුවත් කිරීම එයින් ඔහු අපේක්ෂා කළ දෙයයි.

සොක්‍රටීස් බොහෝ විට උත්සාගෙන තිබෙන්නේ, විතණ්ඩවාදීන් විසින් සමකාලීන සමාජය පුරාම පතුරුවා හරින ලද දර්ශන විෂයට හානිකර සහ මිනිසුන් නොමග යවන වැරදි මත විවේචනය කරමින් සත්‍යගරුක වූ නිවැරදි මත සමාජගත කිරීම පිණිසය. එහිදී ඔහු විශේෂ වශයෙන් අවධාරණය කරන ලද්දක් නම් දැනුම සහ සදාචාරය දෙකක් නොව එකක් බවයි. එනම් ඥානය සහ සද්ගුණය දෙකක් නොව එකක් බව කීමයි. 'මොහුගේ දර්ශනය ආරම්භ වන්නේ විතණ්ඩවාදීන්ගේ දාර්ශනික අදහස්වලට තදබල විරෝධය පාමිනි. විතණ්ඩවාදීන් සියලු ප්‍රපඤ්චයන් සාපේක්ෂක බව පවසන අතර සොක්‍රටීස්ගේ

පිළිගැනීම වූයේ සත්‍ය, ඥානය, ආගම, සදාචාරය වැනි ප්‍රපඤ්චයන් එසේ නොවන බවකි. මේවා සර්ව සම්පූර්ණය. නියති ස්වභාවයෙන් යුතුය. තව ද සහජ ස්වභායක් උසුලන්නකි සද්ගුණය. මනුෂ්‍ය ස්වභාවයෙහි සහජයෙන් චිත්තවේග, සහජාසයන් වැනි දේ තිබෙන්නාක් සේම සද්ගුණය ද සහජයෙන් ම පිහිටන බවකි, සොක්‍රටීස්ගේ දර්ශනයෙහි පදනම'.[22] සොක්‍රටීස් අතින් සිදු වුණු තවත් සුවිශේෂී කාර්යයක් නම් මෙතෙක් දර්ශන විෂයයේ කේන්ද්‍රීය තේමාව වූ භෞතික ලෝකය පිළිබඳ විශ්ලේෂණ වෙනුවට මිනිසා හා ඔහුගේ සිතුම් පැතුම් පිළිබඳ විශ්ලේෂණය කරලියට ගැනීමයි.[23] මෙසේ සොක්‍රටීස් දර්ශන ඉතිහාසයේ දැවැන්ත පෙරළියක් සිදු කළා සේම තමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස ප්ලේටෝ වැනි යුග පුරුෂයකු නිර්මාණය කිරීමට ද දායකවීම අතිශය අගය කටයුත්තකි. එහෙත් සොක්‍රටීස්ට වඩා ඉදිරියට ගිය සොක්‍රටීස්ගේ දාර්ශනික සංකල්ප ප්‍රතික්ෂේප කෙරෙන දාර්ශනික අදහස් පද්ධතියක් ප්ලේටෝ ඉදිරිපත් කරයි. විටෙක ප්ලේටෝ සොක්‍රටීස්ව දැඩි ලෙස විවේචනය කරයි. විශේෂයෙන් ඥානවිභාගය සම්බන්ධයෙන් මෙම විවේචන දැකගත හැකිය.

ග්‍රීක දර්ශන ඉතිහාසයෙහි ඉතාම පැහැදිළි ලෙස යථාර්ථය පිළිබඳ ද්වෛතවාදී (**Dualism**) දර්ශනයක් ගෙනහැර දැක්වූ දාර්ශනිකයා ලෙස ප්ලේටෝ සැලකේ. එනම් ප්‍රපඤ්ච සහ නිෂ්ප්‍රපඤ්ච වශයෙන් ලෝකය දෙකඩ කිරීමයි.[24] දෘෂ්‍යමාන හෝ විද්‍යමාන හෙවත් අප ප්‍රත්‍යක්ෂ කරන අප නිතර ගැටෙන ලෝකය ප්‍රපඤ්ච ලෝකය වේ. එය යථාර්ථය වූ නිෂ්ප්‍රපඤ්ච ලෝකයේ පිටපතක් වේ. උත්තර සංවේදනීය ලෝකය ලෙස සැලකෙන්නේ ද මෙම නිෂ්ප්‍රපඤ්ච ලෝකයයි.[25] මෙයින් පෙන්වන්නේ, යථාර්ථය සහ එහි පිටපත වශයෙන් ලෝකය ද්වෛතවාදී වන බවකි. අපට ස්වභාවයෙන් ලැබෙන්නේ, යථාර්ථයේ පිටපත් පිළිබඳ දැනුමයි. එය යථාර්ථයෙන් බොහෝ දුරස් වූවකි. ආකෘති ලෝකයේ හෙවත් නිෂ්ප්‍රපඤ්ච ලෝකයේ



පවත්නා ආකෘතීන් පිළිබඳ දැනුම යථාර්ථමය ඥානය වේ. එය ලැබිය හැක්කේ, සුවිශේෂ වූ මනසකින් පමණි. 'ප්‍රපඤ්ච ලෝකය වනාහී පෙනීමක් පමණි. යථාර්ථය නොවේ. ඥානය යැයි පැවසෙන්නේ, උත්තර සංවේදනීය ලොවක් (***Supersensuous World***) පිළිබඳ ඥානය මිස වෙනස් වන්නා වූ ප්‍රපඤ්ච ලෝකය හා බැදි සීමා සහිත 'ඥානය' නොවේ. ප්‍රපඤ්ච ලෝකය හා බැඳී පවතී නම් එම 'ඥානයට' ඥානය යැයි ප්ලේටෝ කියන්නේ නැත. මතයන් කියා පවසන්නේ, එම ප්‍රපඤ්චයන්ටය. ප්‍රපඤ්ච බාහිර ලෝකය හා කිසි දෙයක් පිළිබඳ නොයෙක් මත තිබෙන්නට පුළුවන. ඒවා විසංවාදී වන අවස්ථා ද එමටය. එහෙත් උත්තර සංවේදනීය ලෝකය පිළිබඳ කිසි විට විසංවාදී බවක් ඇත්තේ ම නැත.[26]

අප ජීවත් වන, අප නිතර දකින, අප ගනුදෙනු කරන, මිනිසුන් මුලාවට පත් කරවන මේ ප්‍රපඤ්ච ලෝකය අස්ථිරය. නිරන්තරයෙන් චලනය වේ. 'සත්‍ය අරභයා මිනිසුන් අතර පවතින මත භේදවලට (***Disagreement***) හේතුව මෙම ලෝක දෙක පටලවා ගැනීම නිසා බව ප්ලේටෝ තර්ක කරයි. සැබෑ අවබෝධය ඇති කර වන්නේ, සදාකාලික සංකල්ප අයත් ලෝකය පමණි. ප්‍රභාසයන් (***Appearances***) හෙවත් පෙනීම් අයත් ලෝකය බිහි කරනුයේ, හුදු මත (***Opinions***) පමණි.'[27] එහෙත් ආකෘති ලෝකය-නිෂ්ප්‍රපඤ්ච ලෝකය හෙවත් උත්තර සංවේදනීය ලෝකය එසේ නොවේ. එය සදාකාලිකය. ස්ථිරය. යථාර්ථමයය.[28] 'එම ලෝකයේ පවත්නා දේවල් කිසිවිටෙකත් වෙනස් නොවන අතර ඒවා පරමාර්ථමය වශයෙන් සත්‍ය වන්නේය. දාර්ශනිකයාගේ උත්සාහය සහ කාර්යය විය යුත්තේ මේ සත්‍ය ලෝකය දැනගැනීමයි. එය සර්ව සම්පූර්ණ ඥානය වශයෙන් ඔහු පිළිගෙන ඇත.'[29] 'යථාභූතයක් ඇත්නම් එය ලෝකය නම් වේ. ප්‍රපඤ්ච, ප්‍රවාහී, අස්ථිර, අප ජීවත් වන ලෝකය, කිසිවිට යථාභූතය නොවේ. අප ජීවත් වන ලෝකය ඇතිවී නැතිවී යන්නා වූ ස්වභාවයෙන් යුක්ත හෙයිනි.

53666

ප්ලේටෝගේ දර්ශනය අනුව අස්ථිර ප්‍රපඤ්චයක් යථාභූතය විය නොහැක. යථාභූතය නිර්වචනයෙන් ම අස්ථිර භාවය ප්‍රතිෂේධ කර දමයි. අස්ථිර ප්‍රපඤ්චයන්ට ස්ථිර යථාභූතයේ ඉඩක් නොමැත. යථාභූතය හා අස්ථිරත්වය අවිසංවාදී න්‍යාය බිඳ දමන හෙයිනි. ආකෘති ලෝකය ස්ථිරය. සදාකාලිකය. ඇතිවී නැතිවී යන ස්වභාවය වන ප්‍රවාහී භාවය එහි නොමැත. මෙසේ ප්ලේටෝ විසින් විස්තර කරනු ලබන්නේ, යථාභූත යයි. එනම් උත්තර සංවේදනීය ආකෘති ලෝකයයි.'[30] ප්ලේටෝගේ මේ ද්වෛතවාදී දාර්ශනික චින්තාව ද පසුබිම් කොට ගොඩ නැගෙන ග්‍රීක දර්ශනයේ පාරප්‍රාප්තිය ලෙස සැලකිය හැක්කේ, ඔහුගේ ශිෂ්‍යයා ලෙස සැලකෙන ඇරිස්ටෝටල් සහ ඔහුගේ දර්ශන යයි. ග්‍රීක දර්ශන ඉතිහාසයේ අද්විතීය දාර්ශනිකයා ඔහුය. අනෙක් අතට ග්‍රීක දර්ශයේ උච්චතම අවස්ථාව ද ඇරිස්ටෝටල් ගෙන් නියෝජනය වන්නේ, යයි පැහැදිළිව ම කිව හැකිය.

බටහිර දෙඇගයුම් තර්ක ශාස්ත්‍රයේ පියා[31] ලෙස සැලකෙන ඇරිස්ටෝටල් බටහිර දර්ශනයට වෙනත් කිසිදු දාර්ශනිකයකුට වඩා බොහෝ දේ එකතු කළ මහා දාර්ශනිකයා ලෙස අවිවාදයෙන් පිළිගත යුතුය. ඇරිස්ටෝටල් දක්වා ග්‍රීක දර්ශන ඉතිහාසය නියෝජනය කළ බොහෝ දාර්ශනිකයන්ගේ පෞද්ගලික තොරතුරු මෙන් ම දාර්ශනික චින්තාවන්හි ස්වභාවය යම් යම් අඩුපාඩුකම් සහිතව වුව ද සටහන් කර ඇත්තේ, ඇරිස්ටෝටල් විසිනි. බොහෝ විද්‍යාවන්ට මුල් පියවර තැබූවකු ලෙස ද මොහු හඳුන්වා දිය හැකිය.

ප්ලේටෝගෙන් දර්ශනය විෂය මනාව හැදෑරූ ඇරිස්ටෝටල්, ප්ලේටෝගෙන් පසු ඔහුගේ දර්ශනයේ එන මූලික ම සිද්ධාන්තය වූ ආකෘති වාදය සංස්ථිතිකව, කරුණු කාරණා සහිතව විවේචනය කරමින් ප්‍රතික්ෂේප කරයි.[32] ප්ලේටෝ සඳහන් කරන පරිදි යථාර්ථය ඇත්තේ, නිෂ්ප්‍රපඤ්ච වූ ආකෘතීන් තුළ නොව, ආකෘති ලෝකයේ පිටපතක් ලෙස සැලකෙන ප්‍රපඤ්ච වස්තූන්හි ම බව ඇරිස්ටෝටල් තාර්කිකව සනාථ කරයි. 'බැලූ බැල්මට



අපට පෙනෙන්නේ, ද්‍රව්‍ය සහ ආකෘතිය අහසට පොළව මෙන් වෙනස් තත්ත්වයක් උසුලන බවකි. එහෙත් ඇරිස්ටෝටල්ගේ දර්ශනයෙන් හැඟෙන අන්දමට ද්‍රව්‍යයත් අකෘතියත් එකින් එක වෙන්කළ නොහැක. ද්‍රව්‍යයෙන් තොර ආකෘතියත් ආකෘතියෙන් තොර ද්‍රව්‍යයත් යන උභය ප්‍රපඤ්චයන් ම පාහේ අර්ථශූන්‍යය. පවතින සෑම වස්තුවක් ම සෑම පෞද්ගලික ද්‍රව්‍ය වස්තුවක් ම සෑම ප්‍රපඤ්චයක් ම ද්‍රව්‍ය හා ආකෘතියේ සංකලනයකි. සම්මිශ්‍රණයකි. ප්ලේටෝගේ දර්ශනය වූයේ ආකෘතිය ද්‍රව්‍යයෙන් නිදහස්ව පැවතිය හැකි බවයි. එබැවිනි, ප්‍රපඤ්ච ලෝකයෙන් පිට අමතර ආකෘති ලෝකයක් මවන ලද්දේ. එහෙත් ඇරිස්ටෝටල්ට අනුව එවැනි උපන්‍යාසයක් අනවශ්‍යය. එය නොමැතිව ලෝකය විස්තර කළ හැකි හෙයිනි.'[33] මෙයින් ප්ලේටෝගේ ඥානවිභාගාත්මක මූලික සිද්ධාන්තය ඇරිස්ටෝටල් විසින් ප්‍රතික්ෂේප කෙරේ.

ප්ලේටෝනික ඥාන විභාග වාදය විවේචනය කොට ප්‍රතික්ෂේප කරන ඇරිස්ටෝටල් ඥානයේ සහ ප්‍රඥාවෙහි වෙනසක් ඇති බව දක්වයි.[34] ඥානය සර්ව සම්පූර්ණ වූවක් නොවේ. ඥානය සම්පූර්ණ වන්නේ, ප්‍රඥාව තුළිනි. ඥානය ඉන්ද්‍රිය අනුසාරයෙන් ලබන්නකි. ප්‍රඥාව එසේ ලැබිය හැක්කක් නොවේ. 'ප්‍රඥාව වූකලී, යමක් දෙස බලා සිය කාර්ය අරඹන විද්‍යාඥයා අනතුරුව එම ඉන්ද්‍රිය අනුභූතීන් යළි යළිත් ලබා, අවසානයේ තමාගේ අත්දැකීමට ගොදුරු වූ වස්තූන්ට තුඩුදුන් හේතූන් ගැන කල්පනා කිරීම තුළින් ඉන්ද්‍රිය අනුභූතීන් ඉක්මවා ගොස් ලබන ඥානයට සමාන වන දැනුමකි'[35] මේ නම් ලැබිය හැක්කක් මිස අභව්‍ය වූවක් නොවන බව ද ඇරිස්ටෝටල් අවධාරණය කරයි. මේ සාක්ෂාත් කරණය සඳහා ආචාර ධර්මයේ උපයෝගීතාව ඇරිස්ටෝටලියානු ආචාර ධර්ම පද්ධතිය විමසීමෙන් මනාව ස්ඵුට වේ.

ඇරිස්ටෝටල්ගේ ආචාර ධර්ම පද්ධතිය ද අතිශය වැදගත් තැනක් ගෙන තිබේ. 'නිකොමැකියානු ආචාර ධර්ම',

'ඉවුඩේමෝනියා ආචාර ධර්ම' සහ 'මැග්නා මොරලියා' යන කෘතීන්ගෙන් ඔහුගේ අචාර ධර්ම සංකල්ප මොනවට විග්‍රහ කර තිබේ. මෙයින් 'නිකොමැකියානු ආචාර ධර්ම' කෘතිය විශේෂ වේ. ඔහුගේ අචාර ධර්මයේ සාරය වන්නේ, පරම යහපත සාක්ෂාත් කරණයයි. එහෙත් මෙහි දක්වන පරම යහපත නම් උත්තරීතර හෝ ලෝකෝත්තර යහපතක් නොවේ. යහපත නම් සැපතයි. 'උත්තම මනුෂ්‍ය යහපත, සැපත නම් වේ. මේ සැපත නම් වේ, ආචාර ධර්මයේ විෂය වනුයේ. එය සර්ව සම්පූර්ණ පරමාර්ථ යයි. එය සර්ව සම්පූර්ණ අවසානයයි. සෑම යහපතක ම අවසානය මේ යහපතයි.[36]

## ආන්තික සටහන්

1. කලන්සූරිය, ඒ.ඩී.පී, දර්ශනය හැඳින්වීමක්, දෙවන මුද්‍රණය, සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1987, 06 පිට.
2. Philosophy and science which were not originally separate, therefore born together at the beginning of sixth century. Russell, Bertrand, A History of Western Philosophy, London, 1967 p.25.
3. කලන්සූරිය, ඒ.ඩී.පී. ග්‍රීක දර්ශනය, දෙවන මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007, ,06 පිට.
4. Philosophy begins with Thales who fortunately can be dated by the fact that he predicted an eclipse which according to the astronomers, occurred in the year 585 B.C. Russell, Bertrand, A History of Western Philosophy, Allen and Unwin Ltd London, 1967, p.25.
5. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 13 පිට.
6. විදානගමගේ, කුලසේන, දාර්ශනික ගැටලු, දෙවන මුද්‍රණය, කතෘ ප්‍රකාශන, 2007, 26 පිට.
7. The importance of Thales lies in his having put the philosophical question squarely and in having answered it without reference to mythical beings. He declared water to be the original stuff, basing his inference, perhaps, on the observed fact what many elements essential to life (nourishment, heat, seed) contain moisture. Thilly, Frank, A History of Philosophy, Reprinted SBW Publishers, New Delhi, 2000, p 16.



8. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 08 පිට.
9. ඉහත, එම, 10 පිට.
10. මහින්ද හිමි, උණුවතුරබුබුලේ සහ නන්දිසේන, ජී.ඩබ්, බුද්ධකාලීන ග්‍රීක දර්ශනය I, ප්‍රථම මුද්‍රණය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2009, 6-7 පිටු.
11. ඉහත එම, 15 පිට.
12. රසල් බ'ට්‍රන්ඩ්, බටහිර දර්ශන ඉතිහාසය, ප්‍රථම මුද්‍රණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1970, 39 පිට.
13. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 13-14 පිටු.
14. රසල් බ'ට්‍රන්ඩ්, බටහිර දර්ශන ඉතිහාසය, ඉහත, 41 පිට.
15. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 20 පිට.
16. රසල් බ'ට්‍රන්ඩ්, බටහිර දර්ශන ඉතිහාසය, ඉහත, 56 පිට.
17. කලන්සූරිය, ඒ.ඩී.පී. දර්ශනය හැඳින්වීමක්, ඉහත, 19 පිට
18. ඉහත, එම, 21 පිට
19. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 92-93 පිටු.
20. මහින්ද හිමි උණුවතුරබුබුලේ සහ නන්දිසේන ජී.ඩබ්, බුද්ධකාලීන ග්‍රීක දර්ශනය I, ඉහත, 17 පිට.
21. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 117-118 පිටු.
22. ඉහත, එම, 118 පිට.
23. විදානගමගේ, කුලසේන, දාර්ශනික ගැටලු, ඉහත, 32 පිට.
24. ජයසේකර, කමනී, ග්‍රීක දර්ශනයට පිවිසුමක්, ප්‍රථම මුද්‍රණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002, 81-82 පිටු.
25. කලන්සූරිය. ඒ.ඩී.පී. දර්ශනය හැඳින්වීමක්, ඉහත, 23 පිට

26. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත. 144 පිට.

27. මහින්ද හිමි, උණුවතුරබුබුලේ සහ නන්දිසේන, ජී.ඩබ්, බුද්ධකාලීන ග්‍රීක දර්ශනය I, ඉහත, 62 පිට.

28. එදිරිසිංහ, දයා සහ පෙරේරා, ඥානදාස, දාර්ශනික විමර්ශන, ප්‍රථම මුද්‍රණය, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල 2001, 29 පිට.

29. විදානගමගේ, කුලසේන, දාර්ශනික ගැටලු, ඉහත, 33 පිට.

30. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත, 147 පිට

31. විදානගමගේ, කුලසේන, දාර්ශනික ගැටලු, ඉහත 34 පිට.

32. කලන්සූරිය. ඒ.ඩී.පී. දර්ශනය හැඳින්වීමක්, ඉහත, 24 පිට

33. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත. 182 පිට.

34. කලන්සූරිය, ඒ.ඩී.පී. දර්ශනය හැඳින්වීමක්, ඉහත. 24-27 පිටු.

35. මහින්ද හිමි, උණුවතුරබුබුලේ සහ නන්දිසේන, ජී.ඩබ්, බුද්ධකාලීන ග්‍රීක දර්ශනය I, ඉහත, 109 පිට.

36. කලන්සූරිය, ඒ.ඩී.පී, ග්‍රීක දර්ශනය, ඉහත. 192 පිට.